4 වන පිටෙන්

රාජපක්ෂ ආණ්ඩුවේ තැනක් නැත. අනුර බණ්ඩාරනායක මහතා සියදිවි නසා ගැනීමේ තත්ත්වයට පත් වී ඇත. නමුත් චන්ද්‍රිකාගේ එක් බලාපොරොත්තුවක් ඉෂ්ට වී ඇත. එනම් ජ.වි.පෙ.ට අවශ්‍ය ඕන ආකාරයට ආණ්ඩුව මෙහෙයවීමට රාජපක්ෂ ජනාධිපතිවරයා ඉඩ ලබා දී නැත. සෙසු කරුණු කෙසේ වෙතත් එම කරුණෙන් පමණක් චන්ද්‍රිකාට සැනසීමට පුළුවන.

ජ.වි.පෙ. තම ගමන් මගට අවහිර කළ ආකාරය මහින්ද රාජපක්ෂ මහතා නොදන්නවා නොවේ. ඒ පිළිබඳ හොඳ අවබෝධයකින් පසුවන මහින්ද දැන් නිසි තැන සිට ජ.වි.පෙ.ට නිසි පිළිතුරු ඉතාමත් උපක්‍රමශීලි ලෙස දක්වන බවක් පෙනේ. ඔහු එම කාර්ය කරන්නේ අතපයවල ගා ගන්නේ නැතිව හොඳට අත්මේස් දමා ගෙනය. වරක් 2003 වර්ෂයේදී විද්වතුන්ගේ අදහස් හා යෝජනා ඒකරාශී කර එ.ජා.ප. ආණ්ඩුව පරාජය කර සන්ධාන ආණ්ඩුවක් පිහිටුවීම උදෙසා සකස් කළ රහස් සැලැස්මක් මංගල සමරවීර මහතාගේ ගමන් බෑගයේ තිබියදී මහින්ද රාජපක්ෂ මහතාගේ පාර්ශ්වය සොර-කම් කර එ.ජා.ප. හිතැති ජනමාධ්‍යවලට ලබාදුන් බවට ජ.වි.පෙ. ජනමාධ්‍යවලින් රාජපක්ෂ මහතාට චෝදනාවක් එල්ල විය. ඒ හරහා ජ.වි.පෙ. මහින්ද හැඳින්වූයේ පොදු පෙරමුණු ජ.වි.පෙ. විරෝධී එ.ජා.ප. හිතැති අයෙකු ලෙසය. මහින්දගේ උපදේශකයෝ එ.ජා.ප. ප්‍රබලයෝ බවටද චෝදනා එල්ල විය. එදා මහින්ද මේ සියලු චෝදනා ඉදිරියේ නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළා මිස එයට පිළිතුරු දීමට ගියේ නැත. කෙසේ වෙත්ත සිය පාලන කාලය පුරාවට වරින් වර ජ.වි.පෙ. රවටා අවශ්‍ය වැඩ කොටස කර ගැනීමට සමත් වූ චන්ද්‍රිකා අවසානයේ ජ.වි.පෙ. සියලු අභිප්‍රායන් ඉවත දමමින් මහින්දව අගමැති කමට පත්කළේ ඒ හරහා ජ.වි.පෙ. ත් මහින්දවත් අනාථ කිරීමට මිස මහින්දට ඇති ආදරයකින් නොවේ.

**චන්ද්‍රිකාගේ සිහිනය බොඳ විය**

චන්ද්‍රිකාගේ සිය පාලන කාලය අවසන් වීමත් සමග ඊළඟට ජනාධිපති සටනට පිවිසෙන්නේ මහින්දය. ඔහුට එම සටනින් ජයග්‍රාහණය කිරීමට නම් අනිවාර්යයෙන්ම ජ.වි.පෙ. සහාය අවශ්‍ය වනු ඇත. නමුත් එම දෙපාර්ශ්වයේ ඇති මතභේද නිසා ජ.වි.පෙ. සහාය මහින්දගේ ජනාධිපති සටනට නොලැබෙන බව චන්ද්‍රිකා සිතුවාය.

එවැනි තත්ත්වයක් තුළ ජනාධිපති සටනින් මහින්ද රාජපක්ෂ පරාජය වේ. ඉන් එ.ජා.ප. ජනාධිපති අපේක්ෂකයා ජයග්‍රාහණය කරන බවට චන්ද්‍රිකා බණ්ඩාරනායක සිහින මැව්වාය. නමුත් චන්ද්‍රිකාගේ සිහිනය බොඳ වූවාය. මහින්ද රාජපක්ෂ උපක්‍රමශීලී විය. "රෑ වැටුණු වළේ දවලුත් වැටේ" යන න්‍යායට ගොදුරු වූ ජ.වි.පෙරමුණ එල්ලෙන්න වැල් නැති මිනිසාට පිදුරු ගසක් ලොකු දෙයක් කීවා සේ චන්ද්‍රිකාගෙන් ගිලිහුණු අත් වැලෙන් මහින්ද රාජපක්ෂ අත්වැලට ප්‍රවිෂ්ටවීමට ජ.වි.පෙ. ක්‍රියා කළේය. මහින්ද රාජපක්ෂ වැඩේ අත හැරියේ නැත. අතට ලැබුණු දෙය කටේ දමා ගැනීමේ න්‍යායට පරිවර්තනය වුණු මහින්ද ජනාධිපති සටනින් ජය ගැනීම උදෙසා ජ.වි.පෙ. උපරිම දායකත්වය ලාබා ගැනීමට තීරණය කෙරිණි.

ශ්‍රී.ල.නි.ප. ය, ජ.වි.පෙ. ඇතුළු සියලු බලවේග පෙරටු කොට ගත් මහින්ද ජනාධිපති සටන දියත් කළේ එබැවිනි. 2004 දී චන්ද්‍රිකා සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඉන් රැවටී සිටි ජ.වි.පෙ. තවදුරටත් පාඩම් ඉගෙන නොගෙන මහින්ද සමග ගිවිසුමකට එළඹුනේද මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේය. ඒ තුළින් කෙසේ හෝ මහින්ද රාජපක්ෂ ජනාධිපති සටනේ ජයග්‍රහණය සහතික කිරීමට සමත් විය. නමුත් ජ.වි.පෙ. චන්ද්‍රිකා ආණ්ඩුව තුළ මෙන් මහින්ද ආණ්ඩුවෙන් මැති ඇමැති තනතුරු ලබා ගන්නට ගියේ නැත. එහෙත් පාර්ලිමේන්තුවේ ස්වාධීන පිරිසක් ලෙස සිට ආණ්ඩුවට අවශ්‍ය ප්‍රමාණයට සහාය පළ කිරීමේ ස්ථාවරයක පිහිටා කටයුතු කළේය. නමුත් මහින්ද රාජපක්ෂ මහතාගේ ස්ථාවරය වුණේ එය නොවේ. ඔහුගේ එකම හා පරම අභිප්‍රාය වුණේ ජ.වි.පෙ. සෘජුවම ආණ්ඩුවට සම්බන්ධ වී මැති ඇමැති තනතුරු ලබා ගෙන ආණ්ඩුවට සෘජු සහයක් ලබා ගැනීමටය. එහෙත් ජ.වි.පෙ. කැමැති වුණේ නැත. නමුත් ආණ්ඩුවට එකතු වන ලෙස මහින්ද රාජපක්ෂ මහතාගේ පාර්ශ්වයෙන් නිතර දෙවේලේ ජ.වි.පෙ.ට ඇයුරම් ලැබිණි. අවසාන මොහොතේ ජ.වි.පෙ. එයට කිසියම් සහනදායී ප්‍රතිචාරයක් ලබාදීමට ඉදිරිපත් විය.

ඒ රාජපක්ෂ ආණ්ඩුවට යෝජනා 20 ක් ඇතුළත් ලියවිල්ලක් ඉදිරිපත් කරමිනි. එම යෝජනා වලට එකඟ වන්නේ නම් ආණ්ඩුවට එකතුවීමේ ප්‍රශ්නයක් නැති බව ජ.වි.පෙ. ප්‍රකාශ කර සිටියේය. එම යෝජනාවලියේ අඩංගු කරුණු 20 න් කරුණු 04 කට එකඟවීමට නොහැකි බව ආණ්ඩුව ප්‍රකාශ කළේය. ඒ සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම, නෝර්වේ නියෝජිතයන් රටින් පැන්නීම, උතුරු නැගෙනහිර පළාත වෙන් කිරීම හා ඇමැති මණ්ඩලය අඩු කිරීමය. නමුත් එම වැදගත් යෝජනා 04 ට ආණ්ඩුව එකඟ නොවීම නිසා ජ.වි.පෙ. ආණ්ඩුවට එක්වීමෙන් සහ තවදුරටත් ඒ පිළිබඳ කතා කිරීමේ ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන්ම ඉවත් විය. එහෙත් ඒ වගේම මහින්දගේ ආණ්ඩුව ජ.වි.පෙ.න් කරගත යුතු බොහෝ දේවල් කරගෙන තිබිණි. එමගින් රැවටුණොත් මහින්ද නොව ජ.වි.පෙරමුණය.

**ජ.වි.පෙ. ඉත්තෙක්වීම**

චන්ද්‍රිකා මෙන්ම මහින්දත් මැතිවරණ දිනා සිය බලය තහවුරු කර ගැනීමට පමණක් ජ.වි.පෙ.ඉත්තෙක් ලෙස භාවිතා කළ බව නොකියමනාය. එය ඕනෑම අයෙකුට චන්ද්‍රිකාගේත් මහින්දගේත් මැතිවරණ ජයග්‍රහණවලින් අනතුරුව ජ.වි.පෙ.ට ඔවුන් දැක්වූ දේශපාලන ප්‍රතිචාරවලින් මනාව පසක් වේ. එපමණක් නොව ඔවුන් දෙදෙනාම අවසා-නයේ ජ.වි.පෙ.ට රිදවීම උදෙසා විවිධ උපාය උපක්‍රම හා ක්‍රියාමාර්ග ගත්බව නොරහසකි. ඉන් එක් හොඳම නිදසුනක් වන්නේ ජ.වි.පෙ. ට රිදවීම උදෙසා මහින්ද එ.ජා.ප.ය සමඟ ජාතික එකඟතාවක් ඇති කරගැනීම උදෙසා සාකච්ඡා කර අවබෝධතා ගිවිසුමක් ගැසීමට උත්සාහ කිරීමය.

මහින්ද රාජපක්ෂ මහතාට මේ රටේ ජනාධිපතිවීම උදෙසා සියලු වෙර වීරිය දමා ක්‍රියා කළේ ජ.වි.පෙ. මිස එ.ජා.ප.ය නොවේ. එදා එ.ජා.ප.ය උත්සාහ කළේ මහින්ද ජනාධිපති සටනින් පරාජය කිරීමටය. එවැනි තත්ත්වයක් තුළ මහින්ද ජ.වි.පෙ. පැත්තකට තල්ලු කර දමා තමාව පරාජය කිරීමට පෙරමුණ ගත් එ.ජා.ප. සමඟ අත්වැල් බැඳ ගැනීමට තරම් ඉදිරියට යෑම ජ.වි.පෙ.ට එල්ල කළ අතුල් පහරකි.

දේශපාලනයේදී සිය බලය රැකගැනීම උදෙසා ඕනෑම පහළ ශ්‍රේණියේ වැඩක් වුවත් කිරීමට පසුබට නොවන බව ප්‍රකාශ කරන්නේ මෙන්න මෙවැනි දේවල් වලටය. එහිදී ඔවුන්ට සතුරාද! මිතුරාද! යන ප්‍රශ්නය පැන නගින්නේ නැත.

ජ.වි.පෙ. නිතර දෙවේලේ ප්‍රකාශ කරන දෙයක් නම් ඉතිහාසය හදාරා ඒ හරහා අනාගතය ගොඩනැගිය යුතු බවය. නමුත් එහෙම කියන ජ.වි.පෙ. ඉතිහාසයේ සිදුවූ අත්වැරදීම්වලින් හා අත්දැකීම්වලින් පාඩම් ඉගෙන ගෙන අනාගතයට ප්‍රවිෂ්ට වූ බවක් පෙනෙන්නට නැත.

සිදු වී ඇත්තේ ඉතිහාසයේ සිදුවූ වැරදි තව තවත් කිරීමය. එහිදී 1994 විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ පොරො-න්දුවත් පරිවාස ආණ්ඩුත්, අවබෝධතා ගිවිසුමත් කඩා බිඳ දමා ජ.වි.පෙ. රවටා ඇති අවස්ථාවක ඒවායෙන් පාඩම් ඉගෙන ගෙන මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළ ජ.වි.පෙ.ට ක්‍රියා කිරීමේ හැකියාව තිබිණ. නමුත් සිදුවූයේ වෙනත් දෙයකි. ජ.වි.පෙ. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළත් දුර දක්වා නුවණින් යුතුව කටයුතු නොකළ නිසා අද ඔවුන් අසරණ වී ඇත. මහින්දගේ ගැටවලට ජ.වි.පෙ. අසුවිය. එම නිසා අද ඔවුන්ට ආණ්ඩුවත් ජන පදනමත්, තම පක්ෂයේම මන්ත්‍රීවරුත්, අහිමි වී යෑමේ තර්ජනයට මුහුණ පා ඇත.





